ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1997 අංක 14 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 ජුලි මස 22 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ජුලි මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 8.00 යි.

තැපැල් ගාස්තුව : රු. 4.10 යි.

# 1997 අංක 14 දරන
# සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1997 ජූලි මස 22 වැනි දින]

එල්. ඩී. – ඕ. 73/95.

## සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1997 අංක 14 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

101 වන අධිකාරයේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 55 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

> "(1) පැමිණිල්ල ඉදිරිපත් කරනු ලැබ, 49 වන වගන්තියෙන් නියම කර ඇති හෝ සංක්ෂිප්ත ප්‍රකාශය ඉදිරිපත් කරනු ලැබූ විට, නඩුව අධිකරණයෙහි පවරනු ලැබූ දිනයේ සිට මාස තුනකට වඩා පසු නොවන දිනයක් විය යුතු, සිතාසියෙහි සඳහන් දිනයක හෝ එදිනට පෙර පැමිණිල්ලට උත්තර සපයන ලෙස නියම කරමින්, අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් කරන ලද, පළමුවන උපලේඛනයේ අංක 16 දරන ආකෘතිය අනුව වූ සිතාසියක් නිකුත් කරන ලෙස අධිකරණය විසින් අඥා කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 59, 60 හා 61 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 59, 60 හා 61 වන වගන්ති ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

"සිතාසි භාරදීම ලියාපදිංචි තැපෑලෙන් විය යුතු බව.

59. (1) සාමාන්‍යයෙන් ලියාපදිංචි තැපෑලෙන් සිතාසි භාර දෙනු ලැබිය යුතු ය.

(2)(අ) සංස්ථාවක් හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන්වන විට ඒසංස්ථාවේ

හෝ පුද්ගල මණ්ඩලයේ ලියාපදිංචි කළ කාර්යාලයට හෝ ලියාපදිංචි කළ කාර්යාලයක් නොමැති නම් එහි ප්‍රධාන ව්‍යාපාර ස්ථානයකට හෝ සිතාසි භාර දෙනු ලැබිය හැකි ය.

(ආ) විත්තිකරු රාජ්‍ය නිලධරයකු වන අවස්ථාවක, අධිකරණය විසින් ඒ විත්තිකරු සේවයෙහි නියුක්තව සිටින දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වෙත ලියාපදිංචි තැපෑලෙන් ඒ සිතාසි යවනු ලැබිය හැකි අතර, විත්තිකරු වෙත ඒ සිතාසි පෞද්ගලිකවම භාරදෙනු ලැබීමට සැලැස්වීම ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ කාර්යය විය යුතු ය.

(ඇ) විත්තිකරු වෙනත් තැනැත්තකු යටතේ සේවයෙහි නියුක්තව සිටින බවට මුල් බැල්මෙන් ම අධිකරණය සෑහීමට පත්වන අවස්ථාවක, අධිකරණය විසින් සේවායෝජක වෙත ඔහුගේ ව්‍යාපාර ස්ථානයට හෝ සේවායෝජක සමාගමක් හෝ සංස්ථාවක් නම්, ඒ සමාගමේ හෝ සංස්ථාවේ යම් ලේකම්වරයකු, කළමනාකරුවකු හෝ වෙනත් සමාන නිලධරයකු වෙත අධිකරණය විසින් සිතාසි යවනු ලැබිය හැකි අතර, විත්තිකරු වෙත ඒ සිතාසි පුද්ගලිකව ම භාර දෙනු ලැබීමට සැලැස්වීම අවස්ථාවෝචිත පරිදි ඒ සේවායෝජකගේ හෝ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(3) විත්තිකරු නොවන වෙනත් තැනැත්තකු වෙත ලියාපදිංචි තැපෑලෙන් සිතාසි යවනු ලබන සෑම අවස්ථාවක ම, අධිකරණය විසින් එම සිතාසියේ අනුපිටපතක් ද යැවිය යුතු අතර, සිතාසි

ලැබුණු බවට විත්තිකරු විසින් කරන ලද සටහනක් හෝ අධිකරණය විසින් සිතාසි යවනු ලැබූ තැනැත්තා විසින් ම සිතාසි භාර දීම නො කරන ලද්දේ නම්, සිතාසි භාර දීම කළ තැනැත්තා විසින් සිතාසි භාර දුන් බවට එහි පිටසන් කර අත්සන් යෙදූ ප්‍රකාශයක්, ඔහුගේ අතු අත්සන ද සමග, අධිකරණය වෙත ආපසු එවීම, අවස්ථාවෝචිත පරිදි, ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ, සේවා යෝජකයාගේ හෝ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(4) ඉහත සඳහන් ආකාරයට විත්තිකරුවකු වෙත භාර දීමෙන් පසු, ඔහු පුද්ගලිකව ම අධිකරණයෙහි පෙනී සිටින අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඔහු විසින් ඔහුගේ ජාතික හැඳුනුම් පත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, තමා ඉදිරියේ පෙනී සිටින තැනැත්තා සහ ඉහත කී ආකාරයට සිතාසි භාර දෙනු ලැබූ තැනැත්තා එකම හා එම තැනැත්තාම බවට සෑහීමට පත්වීම විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය.

(5) විත්තිකරුවකු ලේඛනගත නීතිඥවරයකු විසින් නියෝජනය කරනු ලබන අවස්ථාවක, විත්තිකරු වෙනුවෙන් නීතිඥවරයා විසින් ඉදිරිපත් කරනු ලබන පෙරකලාසියෙහි, අවස්ථාවෝචිත පරිදි, විත්තිකරුගේ හැඳුනුම් පත්‍රයේ හෝ විදේශ ගමන් බලපත්‍ර අංකය සඳහන් කරනු ලැබිය යුතු අතර, ඒ විත්තිකරුගේ අනන්‍යතාව සහතික කරමින් එහි පිටසනක් ද කරනු ලැබිය යුතු ය. සමාගමක් හෝ සංස්ථාවක් වෙනුවෙන් පෙරකලාසියක් ඉදිරිපත් කරන අවස්ථාවක, ඒ පෙරකලාසිය අවස්ථාවෝචිත පරිදි, ඒ සමාගමේ හෝ සංස්ථාවේ මුද්‍රාව යටතේ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තියේ —

"දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා" යන්නෙන්—

(අ) එය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ, හෝ ගුවන් හමුදාවේ යම් අංශයක සාමාජිකයකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ අංශයේ අණ දෙන නිලධරයා ඉන් අදහස් වේ ;

(ආ) එය පළාත් පාලන ආයතනයක සේවයෙහි නියුක්ත තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ පළාත් පාලන ආයතනය මහ නගර සභාවක් නම්, ඒ සභාවේ නාගරික කොමසාරිස්වරයා සහ ඒ පළාත් පාලන ආයතනය නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් නම් ඒ සභාවේ සභාපතිවරයා ඉන් අදහස් වේ ;

(ඇ) එය වෙනත් යම් රාජ්‍ය නිලධරයකු සම්බන්ධයෙන් යෙදෙන විට ඒ තැනැත්තා සේවයෙහි නියුක්ත රජයේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා ඉන් අදහස් වේ ; තවද

"ජාතික හැඳුනුම් පත්‍රය" යන්න යම් තැනැත්තකු හා සම්බන්ධව යෙදෙන විට, 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඒ තැනැත්තා වෙත නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය ඉන් අදහස් වේ.

පෞද්ගලිකව භාර දීම.

60. (1) භාර දීම ලියාපදිංචි තැපැලෙන් කළ නොහැකි වූ බව වාර්තා කරනු ලැබූ අවස්ථාවක හෝ සිතාසි ලියාපදිංචි තැපැලෙන් භාර දෙනු ලැබූ නමුත් පැමිණ පෙනී සිටීම විත්තිකරු විසින් පැහැර හැර ඇති අවස්ථාවක පිස්කල්වරයාගේ මාර්ගයෙන්

හෝ විත්තිකරු පදිංචිව සිටින්නේ යම් ග්‍රාම නිලධාරියකුගේ කොට්ඨාසය තුළ ද, ඒ ග්‍රාම නිලධාරියාගේ මාර්ගයෙන් ඒ සිතාසි විත්තිකරු වෙත ගෙන ගොස් භාර දීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් ඒ සිතාසි ඔහු වෙත පුද්ගලිකව භාර දෙන ලෙස අධිකරණය විසින් විධාන කරනු ලැබිය යුතු ය ; නැතහොත් පැමිණිලිකරු, 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අර්ථානුකූලව ණය දෙන ආයතනයක් වන යම් අවස්ථාවක, පළමුවන උපලේඛනයේ අංක 17 දරන ආකෘතියෙහි වූ අණ පත්‍රයක් ද සමඟ පිස්කල්වරයා හෝ අධිකරණය විසින් බලය දෙන ලද වෙනත් නිලධරයකු මගින් සිතාසි භාර දෙනු ලැබිය යුතු ය. සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, ඒ සංස්ථාවේ ලේකම්වරයාට හෝ ඒ හා සමාන නිලධරයකුට නැතහොත් අධ්‍යක්ෂවරයකුට හෝ එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය භාරව සිටින තැනැත්තාට හෝ ඒ සිතාසි ගෙන ගොස් භාරදීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් පුද්ගලිකව භාර දෙනු ලැබිය හැකි ය.

(2) අවශ්‍ය උද්යෝගයෙන් යුතුව ක්‍රියා කිරීමෙන් පසුව ද මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල සඳහන් භාර දීම ක්‍රියාත්මක කළ නොහැකි වුවහොත්, පිස්කල්වරයා හෝ ග්‍රාම නිලධාරියා විසින් විත්තිකරු සාමාන්‍යයෙන් වාසය කරන ගෘහයේ යම් ප්‍රකටව පෙනෙන ස්ථානයක හෝ සංස්ථාවක් හෝ සංස්ථාගත නොකරන ලද පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් වන විට එම සංස්ථාවේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාන්‍ය ව්‍යාපාර ස්ථානයේ හෝ කාර්යාලයේ ප්‍රකටව පෙනෙන ස්ථානයක සිතාසිය අලවනු ලැබිය යුතු අතර, ඒ සෑම අවස්ථාවක දී ම ඒ සිතාසිය යථා පරිදි විත්තිකරු වෙත භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

භාර දීම ඔප්පු කිරීම.

61. සිතාසියක් ලියාපදිංචි තැපෑලෙන් භාර දෙනු ලැබූ විට, දේශීය තැපැල් රීති යටතේ නිකුත් කරනු ලැබූ භාර දීමේ නිවේදනය ද, භාර දීම පිළිබඳ පිටසන් කිරීමක් තිබේ නම් එය ද, වෙනත් යම් ආකාරයකින්

සිතාසිය භාර දෙනු ලැබූ අවස්ථාවක, ඒ භාර දීම පිළිබඳ දිවුරුම් පත්‍රයක් ද සිතාසිය භාර දෙනු ලැබූ බවට සහ ඒ භාර දීමේ දිනය පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, එය සාක්ෂියේ දී ආවේශ්‍ය විය යුතු ය. තව ද, එහි අතුළත් ප්‍රකාශ, පටහැනි තත්ත්වය ඔප්පු කළහොත් මිස හා ඔප්පු කරනු ලබන තෙක් නිරවද්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ "යම් දිනයක" යන වචන වෙනුවට "පැමිණිල්ලට උත්තරදීමට ඔහුට කලින් නියම කරනු ලැබූ දිනයේ සිට මාස තුනක් පසු නොවන දිනයක් වන යම් දිනයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 209 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 209 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ගාස්තු දීමට හෝ එය කල් තැබීමට අධිකරණයට සැම විටම බලය ඇති බව.

209. සාමාන්‍ය කාර්ය පටිපාටියට අනුව වුවද ලඝු කාර්ය පටිපාටිය අනුව වුවද මේ ආඥාපනත යටතේ යම් ඉල්ලීමක් හෝ නඩුවක් පිළිබඳව සුදුස්සක් කිරීමේ දී, මේ ආඥාපනතේ අන් තැනක අන්‍යාකාරයෙන් විධාන කර ඇත්නම් මිස, ඒ ඉල්ලීමේ හෝ නඩුවේ ගාස්තු දෙපාර්ශ්වයෙන් එක් පාර්ශ්වයකට දීම හෝ ඒ ගාස්තු ගැන සලකා බැලීම නඩු කටයුත්තේ යම් මතු අවස්ථාවකට කල් තැබීම, අධිකරණය විසින් කළ හැකි ය. අධිකරණය විසින් එකී ආඥාවෙහි, ඒ ඉල්ලීමේ හෝ නඩුවේ ගාස්තු ප්‍රමාණය නියම කරනු ලැබිය හැකි ය ; එසේ වුවද එසේ නියම කරන ලද මුදල, ඒ වර්ගයේ ඉල්ලීමක දී හෝ නඩුවක දී, 214 වන වගන්තියේ කාර්ය සඳහා නියම කරනු ලැබිය හැකි යම් අනුප්‍රමාණ අනුව දෙනු ලබන ගාස්තු ප්‍රමාණයෙන් සියයට පණහකට අඩු නොවිය යුතු අතර, ඒ වර්ගයේ ඉල්ලීමක දී හෝ නඩුවක දී 214 වන වගන්තියේ කාර්ය සඳහා නියම කර ඇති යම් අනුප්‍රමාණ අනුව දෙනු ලබන ගාස්තු ප්‍රමාණයෙන් සියයට දෙසීයකට වැඩි නොවිය යුතු ය. ගාස්තු පමණක් ගෙවීම සඳහා වූ යම් ආඥාවක්, වාරිකවලින් ගෙවීම සම්බන්ධයෙන් 194 වන වගන්තියේ විධිවිධානවලට අයත් මුදල් පිළිබඳ තීන්දු ප්‍රකාශයක් වන්නේ ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 210 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 210 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ඇතැම් අවස්ථාවල දී කවරකු විසින් ගාස්තු ගෙවිය යුතු ද යන්න හා වටිනාකම ඇස්තමේන්තු කිරීම අධිකරණය විසින් විධාන කළ යුතු බව.

210. එක් එක් පාර්ශ්වකරුගේ ගාස්තු කවරකු විසින් ගෙවිය යුතු ද යන්න ද, එය සම්පූර්ණයෙන් ගෙවිය යුතු ද නැතහොත් කවර කොටසක් ගෙවිය යුතු ද නැතහොත් සමානුපාතයක් අනුව ගෙවිය යුතු ද යන්න ද තීන්දු ප්‍රකාශයෙන් හෝ ආඥාවෙන් විධාන කළ යුතු ය. නියමිත යම් නඩු පන්ති සම්බන්ධයෙන් පටහන් කරනු ලබන තීන්දු ප්‍රකාශවල දී, අධිකරණය විසින් නඩුවේ වටිනාකම පිළිබඳ එහි ඇස්තමේන්තුව දිය යුතු අතර, ඒ ඇස්තමේන්තුව, 214 වන වගන්තියේ කාර්ය සඳහා නියමිත අනුප්‍රමාණ ඒ නඩුවට අදාළ කිරීමේ කාර්ය සඳහා ඒ නඩුවේ වටිනාකම ලෙස සලකනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 211 වන වගන්තිය පහත දැක්වෙන ලෙස මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 211 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

(2) නැවත අංක කරන ලද '(1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(2) (1) වන උපවගන්තිය යටතේ වූ අධිකරණයේ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, යම් පාර්ශ්වකරුවකුට විරුද්ධව අනෙක් පාර්ශ්වකරු විසින් ඉදිරිපත් කරනු ලබන යම් නිශ්ඵල හෝ පීඩාකාරී ඉල්ලීමක් හෝ විත්ති වාචකයක් සම්බන්ධයෙන් වන විට නැතහොත් යම් පාර්ශ්වකරුවකුට අනෙක් පාර්ශ්වකරුවකුගේ ප්‍රමාදයක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් හෝ අනික් පාර්ශ්වකරු විසින් යම් අනවශ්‍ය හෝ අසාධාරණ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හටගත් යම් වියදම් දැරීමක් සම්බන්ධයෙන් වන විට, අධිකරණය විසින් මුලින් සඳහන් කළ පාර්ශ්වකරුට ගාස්තු දෙනු ලැබිය හැකි ය. එසේ වුව ද එසේ ආඥා

කරනු ලබන ගාස්තු කවර වූ හෝ විටක දී ඒ වර්ගයේ ඉල්ලීමක දී හෝ නඩුවක දී 214 වන වගන්තියේ කාර්ය සඳහා නියම කර ඇති අනුප්‍රමාණ අනුව ආඥා කරනු ලැබිය හැකි ගාස්තු ප්‍රමාණයෙන් සියයට පන්සියයක් නොඉක්මවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 213 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 213 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අධිකරණය විසින් නඩු ගාස්තුවලට පොළියක් නියම කරනු ලැබිය හැකි බව.

213. ගාස්තු වෙනුවෙන්, ආඥාපනතේ 192 වන වගන්තියේ සඳහන් කර ඇති පරිදි, තීන්දු ප්‍රකාශයේ දින සිට ගණන් බලන ලද වර්ෂයකට නෛතික අනුප්‍රමාණය අනුව වූ පොළියක්, අධිකරණය විසින් නියම කළ හැකි අතර, ඒ ගාස්තු පොළියත් සමග හෝ පොළිය නොමැතිව නඩුවෙහි විෂය වස්තුවෙන් ගෙවිය යුතු යයි හෝ නඩුවෙහි විෂය වස්තුවකට වැය බරක් කළ යුතු යයි අධිකරණය විසින් විධාන කළ හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 214 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 214 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ගාස්තු තක්සේරු කළ යුතු බව.

214. පාර්ශ්වකරුවකු හා පාර්ශ්වකරුවන් අතර හෝ ලේඛනගත නීතිඥවරයා හා සේවාදායක අතර වූ සියලු ගාස්තු බිල් පත්‍ර, නියමිත යම් අනුප්‍රමාණ අනුව අවස්ථාවෝචිත පරිදි අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් තක්සේරු කරනු ලැබිය යුතු ය. තවද දෙපාර්ශ්වකරුවන්ගෙන් එක් පාර්ශ්වකරුවකු මෙසේ තක්සේරු කිරීම පිළිබඳව සෑහීමට පත් නොවුවහොත්, විවාදාපන්න කාරණය තීරණය කිරීම සඳහා අධිකරණය වෙත යොමු කරනු ලැබිය යුතු අතර, අධිකරණයේ තීරණය (එය අභියාචනාධිකරණයේ තීරණයක් වන අවස්ථාවක දී හැර) අභියාචනාධිකරණය වෙත යොමු කරනු ලබන අභියාචනයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 417අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 417 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 417අ වගන්තිය වශයෙන් බලපැවැත් විය යුතු ය :—

"ගාස්තු ගෙවීම සඳහා ඇප ප්‍රමාණය.

417අ. 416 වන හෝ 417 වන වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් නියම කර ඇති ගාස්තු ගෙවීම සඳහා වූ ඇපය කවර හෝ විටෙක :—

(අ) 214 වන වගන්තියේ කාර්ය සඳහා නියමිත අනුප්‍රමාණ අනුව, ඒ වර්ගයේ නඩුවක දී ආඥා කරනු ලැබිය හැකි ගාස්තුවල මුළු ප්‍රමාණය ; සහ

(ආ) විදේශයන්හි ජීවත්වන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ලබාගැනීමේ දී සහ පැමිණ සිටීමේ දී දරන්නට සිදුවන වියදම් වැනි ආනුෂංගික වියදම් පියවීම පිණිස රුපියල් පන් ලක්ෂයක්

යන ඉහත සඳහන් වියදම්වල මුළු එකතුව නොඉක්මවිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 705අ සහ 705ආ වගන්ති ඉවත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 705අ සහ 705ආ වගන්ති මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 756 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 756 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) අභියාචක පාර්ශ්වකරුවකු විසින් තැන්පත් කළ යුතු බවට නියම කර ඇති ඇපය, අභියාචනයෙහි ගාස්තු පියවීමට ප්‍රමාණවත් වන හා ඊට වැඩි නොවන මුදලක් තැන්පත් කිරීමේ මාර්ගයෙන් හෝ නිශ්චල දේපළ යටත් කොට තැබීමේ මාර්ගයෙන් හෝ ගෙවනු ලැබිය යුතු ය :

එසේ වුවද, ඇපය වශයෙන් මුදල් තැන්පත් කරනු ලබන අවස්ථාවක, ඒ මුදල ගෙවන ලෙස අභියාචකට තීන්දු ප්‍රකාශ කරන ලද නම්, අභියාචකගේ ඒ අභියාචනය පවත්වා ගෙන යාමේ දී දරන්නට සිදු වූ සහ තක්සේරු කරනු ලැබූ සියලු ගාස්තු ගෙවීම සඳහා ඒ මුදල අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ නමින් යටත් කොට බැඳ තබන ලද සේ සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 840 වන අලුත් වගන්තිය එකතු කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 839 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් එකතු කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 840 වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"නියෝග 840. (1) මේ පනතින් නියෝග සෑදීමට නියම කර ඇති හෝ බලය දී ඇති නැතහොත් නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත සියලු කාරණා හෝ ඉන් යම් කාරණයක් සඳහා හෝ ඒවා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට, එහෙත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ අංක 129 දරන ආකෘති පත්‍රය ඉවත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය ඉවත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.